# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2303/10 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 11/9/2/නයාබැදි ඇළ/C9.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/8/2021/UD/49.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනුරාධපුර නගර සහා සීමාව තුළ අංක 255, 3 පියවර I කොටස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ III පියවර ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 110210හි කලාප අංක 05 හි පත්‍ර අංක 13 හි කැබලි අංක 220, 221, 222 සහ 224 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.1951 ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් (04) :

01. කැබලි අංක **220**
ඉඩමේ නම : කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම, තාප්පයකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0006ක් පමණ.

02. කැබලි අංක **221**
ඉඩමේ නම : -; ඉඩම් පරිහරණය: නයාබැදි ඇළ, තාප්පයකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.1172 ක් පමණ.

03. කැබලි අංක **222**
ඉඩමේ නම : කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම, තාප්පයකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0333 ක් පමණ.

04. කැබලි අංක **224**
ඉඩමේ නම : කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0440 ක් පමණ.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.11.15 වැනි දින පෙ.ව.9.00 ට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022.11.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්.එම්.ආර්.පී.බී.ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.